# ළමා නිවාසයත් සුනාමි අරන් ගියා

**ඉනෝකා සමරවික්‍රම**

ඔවුහු මුහුද ගොඩ ගැලීම නිසා අසරණ භාවයෙන් තව තවත් අසරණ බවට පත් වූහ. ඒ ගාල්ල මාගාල්ලේ සම්බෝධි නිවාසයේ ආබාධිත දරු දැරියෝය. ඉකුත් 26 වනදා උදෑසන ඇතැමෙක් රූපවාහිනිය බලමින් පසුවූහ. තවකෙක් තම ඇඳට වී සිටියහ. මුහුද මහ හඬනගා ගොඩගලන ඇසිල්ලේ දුව ගැනීමට පුළුවන් වූවෝ දිවි ගළවා ගත්හ. එහෙත් දුවා ගැනීමට බැරිවූ අසරණයෝ 43 ක් මුහුදට බිලි වූහ. හතළිස් එකකගේ ජීවිත ගැළැවිණි.



**කස්සප හිමි හා කන්‍යා සොයුරිය සම්බෝධි දරුවන්ගේ සුවදුක් විමසමින්**

මේ අනතුරින් දිවි ගළවා ගත් උදර කුමාර අදහස් දක්වමින් මෙසේ කීය.

මුහුද කළ විනාශය තවමත් මේ දරුවන්ගේ හිතේ රැඳී ඇත. කතා කරගැනීමට බැරි, සිදුවූ කිසිවක් තේරුම් ගැනීමට නොහැකිවූ දරුවෝ ද මේ අතර වෙති. ඔවුහු බලාගත් අත බලාගෙන සිටිති. එහෙත් මහ මුහුද ගොඩගලන විට ළමා නිවාසයේ සිටි සේවිකාවෝ එම දරුවන්ගේ දිවි ගළවා ගැනීමට උත්සාහ ගත්හ. සිද්ධිය වූ අවස්ථාව පිළිබඳව විස්තර කරන සරෝජා සෙනෙවිරත්න

අපි හතර දෙනෙක් මේ නිවාසයේ වැඩට ඉන්නවා. එදා ජයන්තයි, කරුණාවතියි මමයි විතරයි හිටියේ. එකපාරට ම වතුර පාරක් ආවා. මොකක්ද වෙන්නේ කියලා අපට හිතාගන්න බැරිවුණා. ඇවිදගන්න පුළුවන් අයව අපි වහලය උඩින් තිබ්බා. ඒ එක්ක ම මා ගහගෙන ගියා. කබඩ් එකක එල්ලිලා තමයි බේරුණේ. කොහොමහරි අපි වහලයට නැග්ගා. ඇඳන්වල හිටපු අය මෙට්ටත් එක්ක ම පාවුණා. අපි එහෙම අය 15 ක් විතර බේරාගත්තා. ළමා නිවාසය දැන් අබලන්. මිනී කිහිපයක් ම ඇතුළේ තිබිලා සොයා ගත්තා. නිවාසය තවමත් අපිරිසුදු නිසා මේ දරුවන්ව ඇතුළේ රඳවා තැබීමට බැහැ. ඒ නිසා හුගක් ම ආබාධිත තත්ත්වයේ ඉන්න අය කරාපිටිය හා උඩුගම රෝහලේ නතර කර සිටිනවා. වළහන්දූව (දෙහිගහවිල) ශ්‍රී සුදර්ශනාරාම විහාරයේ පිරිසක් රඳවා සිටිනවා.



**දරුවන්ගේ දිවි ගලවාගත් සම්බෝධි කාර්යය මණ්ඩලය**

ව්‍යසනයක් වූ හැම විටම පන්සල ගම හා බැඳී සිටියි. මේ දරුවන්ට සිදුවූ විපතේදී ද හාමුදුරුවරු දරුවන්ගේ රැකවරණය පිණිස ඉදිරිපත් වූහ. කරදරය කරදරයකැයි නොසිතා ශ්‍රී සුදර්ශනාරාම විහාරාධිපති තල්ගම්පළ කස්සප හිමියෝ තම පන්සල් භූමිය සම්බෝධි දරුවනට සෙවණක් කර දුන්නා. එහෙත් හැමදම එතැන ඔවුනට ඉන්නට නොහැක. කවදත් කාගේත් දුකට පිහිට වන ගාල්ල කළුවැල්ලේ වැන්රීන් වැඩිහිටි නිවාසය භාරව කටයුතු කරන නොයෙලින් පුංචිහේවා කන්‍යා සොයුරිය නිරන්තරව ම සම්බෝධි දරුවන් පිළිබඳව සොයා බලයි. ඔවුන්ගේ නිවාසය පිරිසුදු කිරීමේ කටයුතුවලට සහාය දක්වයි.



**සම්බෝධි නිවාසයේ පාලන කටයුතු භාරව සිටින දේශප්‍රිය**

වයස අවුරුදු නමයේ සිට සම්බෝධි ළමා නිවාසයේ ම හැදී වැඩුණු කුමාර දේශප්‍රිය අද උසස් පෙළ සමත් යෞවනයෙකි. ළමා නිවාසයට ආදරයෙන් ලැදිව කටයුතු කරන ඔහු මුහුද ගොඩ ගලන බව ආරංචි වී එම අනතුරින් දරුවන් මුදගැනීම සඳහා රෝද පුටුවෙන් ළමා නිවාසය වෙත එමින් සිටියේය. එහෙත් අවට මිනිසුන්ගේ කෑ ගැසීමත්, කලබලයත් නිසා ඔහු උස් බිමකට ගියේය.

"පැය දෙකක් විතර මම එතැන හිටියා. මම පසුව එතැනට ආවා. අඩි 12 ක් විතර උසට නිවාසය ඇතුළට වතුර ඇවිල්ලා. අපේ සහෝදරයෝ බොහෝමයක් මියගියා. දැන් ඒ ගැන හිතලා පලක් නෑ. අපි ආයෙත් අපේ නිවාසයට යන්න ඕන. මේ අය හැමදම පන්සලේ තියන්න බෑ. අපේ සම්බෝධි සහයෝගිතා පදනමේ ලේකම් හැටියට කටයුතු කරන මෙත්සිරි ද සිල්වා සර් අපේ නිවාසය පිරිසුදු කරගැනීමට බොහෝ උදව් උපකාර කළා. ඒ වගේ ම අපේ කෑමබීම ගැන වුණත් හොයලා බලන්නේ සර්."

ඔවුහු අද බෙහෙවින් අසරණය. තමන් මෙතෙක් කලක් සිටි නිවහන පිරිසුදු කරගැනීමට පවා ඔවුනට බැරිය. ආබාධිත හා මන්ද මානසික තත්ත්වයේ සිටින මොවුන් බලාගන්න පිරිසට වැටුප් ගෙවන්නේ රජයෙන්. ආබාධිත දරුවකු සඳහා එක්දිනකට ලැබෙන රුපියල් දහයෙනි. පාසල් යන ළමයින් 22 ක් මේ අනතුරින් දිවිගළවා ගත්ත ද ඔවුන්ට ඔවුන්ගේය කියා කිසිවක් ඉතිරි වී නැත. මුහුදු වතුරට හසුව ගසාගෙන ගිය කිරි-පිටි ප්‍රමාණය කිලෝ 7600 කි. නොගෙවූ වතුර හා විදුලිය බිල් හිඟය ඉතා ඉහළය.

මව පියා විසින් අතහැර දැමූ මේ දරුවන්ට ඇත්තේ ඔබේ පිහිටය.

**ඡායාරූප - විමල් කරුණාතිලක**